# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1767/29 – 2012 ජූලි 20 වැනි සිකුරාදා – 2012.07.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොට්ඨාස අංක 03, මාතර මහ නගර සභා සීමාව තුළ එළියකන්ද සුළු කොට්ඨාසයේ, කුඩාගොඩ ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක එම්ආර්/එම්ටීආර්/2011/416 සහ 2011.10.24 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.7327 ක් පමණ වූ පරගහහේනවත්ත නමැති පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

01. **කැබලි අක්ෂර 'ඒ' – පරගහහේන වත්ත – ප්‍රමාණය: හෙක්. 0.7327 ක් පමණ**

උතුරට: හිමිකම් කියන්නකු ඉදිරිපත් නොවූ පරගහහේන වත්ත, හිමිකම් කියන්නකු ඉදිරිපත් නොවූ පොල් ඉඩම සහ හිමිකම් කියන්නකු ඉදිරිපත් නොවූ බ්‍රවුන්ස්හිල් ලඳු කැලය; නැගෙනහිරට: එල්. ඩී. ඩබ්ලිව්. සෙනෙවිරත්න හිමිකම් කියන පරගහහේන වත්ත සහ මාර්ගය; දකුණට: මාර්ගය සහ හිමිකම් කියන්නකු ඉදිරිපත් නොවූ බ්‍රවුන්ස්හිල්; බටහිරට: හිමිකම් කියන්නකු ඉදිරිපත් නොවූ බ්‍රවුන්ස්හිල්.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 4/3/4/2011/වයිඒ/242.
2012 ජූලි මස 10 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

08 – 166

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දකුණු ගිරුවා පත්තුව සුළු කොට්ඨාසයේ, දෙද්දුවාවල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද අංක එච්/සීජීආර්/බීඑල්ඒ/2011/70 සහ 2011.06.07 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0253 ක් පමණ වූ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – නරුවිල සහ මහ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0253 ක් පමණ**

උතුරට: නරුවිල සහ මහ කුඹුර; නැගෙනහිරට: නරුවිල, මහ කුඹුර සහ දුම්රිය මාර්ග සඳහා අත්කර ගෙන ඇති ඉඩම; දකුණට: දුම්රිය මාර්ගය සඳහා අත්කර ගෙන ඇති ඉඩම සහ නරුවිල, මහ කුඹුර; බටහිරට: නරුවිල සහ මහ කුඹුර.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: 4/3/11/2010/එන්ආර්ඩී/200.
2012 අගෝස්තු මස 03 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 – 167


1A – G 16342 – 370 (2012/07)   ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.